## සසප/ ලෝසවෙඅ ගිම්හාන පාසල 2005

# තෙවැනි දේශනය: බොල්ශෙවික්වාදයේ සම්භවය හා "කල යුත්තේ කුමක් ද?"

## 7 වන කොටස

**Lecture three: The Origins of Bolshevism and *What Is To Be Done?* Part 7**

**ඩේවිඩ් නෝත් විසිනි**
**2005 සැප්තැම්බර් 13**

*2005 අගෝස්තු මස 14 වන දා සිට 20 වන දා දක්වා මිචිගන්හි ඈන් ආර්බර්හි දී පැවැත්වුනු සමාජවාදී සමානතා පක්ෂයේ/ලෝසවෙඅ ගිම්හාන පාසැලෙහි දී ලෝක සමාජවාදී වෙබ් අඩවියේ කර්තෘ මන්ඩල සභාපති ඩේවිඩ් නෝත් විසින් පවත්වනු ලැබූ " බොල්ශෙවික්වාදයේ සම්භවය හා කල යුත්තේ කුමක් ද?" යන දේශනයේ හත් වන හා අවසාන කොටස යි මේ.*

*මෙය පාසැලෙහි පැවැත්වුනු තෙවැනි දේශනය යි.*

### පන්ති විඥානය හා "දේශපාලනික හෙලිදරව් කිරීම්"

එසේ නම්, කම්කරු පන්තියේ දේශපාලන විඥානය වර්ධනය කල යුත්තේ කෙසේ ද? මේ ප්‍රශ්නයට ලෙනින් දී ඇති පිලිතුර වූයේ ප්‍රවේසමෙන් අධ්‍යයනය කල යුතු ය යන්න යි. ආර්ථිකවාදීන්ට නම්, "එදා වේල" පිරිමසා ගැනීම හා බැඳුනු ආර්ථික සටන් සහ කම්හලේ දී මුහුන දෙන තදාසන්න ගැටලු, පන්ති විඥානය වර්ධනයේ ප්‍රධාන මාධ්‍ය විය. එවන් පටු ආර්ථික පදනමක් මත අව්‍යාජ පන්ති විඥානය වර්ධනය කල හැකි ය යන සංකල්පය ලෙනින් සුවිශේෂව ම ප්‍රතික්ෂේප කලේ ය. තදාසන්න ආර්ථික උත්සුකතාවන් සඳහා කෙරෙන අරගල ප්‍රමානවත් වූයේ වෘත්තීය සමිති විඥානයත එනම්, කම්කරු පන්තිය තුල ධනපති විඥානය, වර්ධනය කිරීමට පමනි. විප්ලවවාදී පන්ති විඥානය වර්ධනය වීමට නම්, සමාජවාදීන්, "දේශපාලනික හෙලිදරව් කිරීම්" ලෙස තමා නම් කල දෙය කෙරේ අවධානය යොමු කල යුතුව ඇති බැව් ලෙනින් තරයේ අවධාරනය කලේ ය.

"එබඳු හෙලිදරව් මාධ්‍ය කර ගෙන හැර අන් කවර ක්‍රමයකින් හෝ මහජනයා දේශපාලන දැනුවත් භාවයෙන් හා විප්ලවවාදී ක්‍රියාකාරිත්වයෙන් පුහුනු කල නො හේ. එ බැවින් මේ වර්ගයේ ක්‍රියාකාරිත්වය, සමස්තයක් ලෙස ජාත්‍යන්තර සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ කටයුතු අතර වඩාත් ම වැදගත් එකකි. දේශපාලන නිදහස කිසි ලෙසකිනිදු හෙලිදරව් කිරීම් බැහැර නො කරයි. එය හුදෙක් ඒවායේ දිශානතියෙහි ක්ෂේත්‍රය යම් තරමකින් වෙනස් කරනු පමනකි.'' [27]

ඒවායේ අදාලත්වය කිසිදු අයුරකින් හෝ නොනැසුනු හෝ අප ජීවත් වන කාල පරිච්ඡේදය තුල සමාජවාදී විඥානයේ ස්වභාවය හා වැදගත්කමෙහි තියුනු කඩා වැටීම හේතු කොට ගෙන නොඅඩු වැදගත්කමකින් යුත් -- වචනවලින් ලෙනින් මෙසේ ලිවී යඃ

"කෲර පාලනයේ, මර්දනයේ, හිංසනයේ හා අපවාදයේ **සියලු** අවස්ථාවන්ට, එය කවර පන්තිය කෙරේ බලපාන්නේ ද යන්න නො තකා ප්‍රතිචාර දැක්වීමට කම්කරුවන් පුහුනු කල හොත් විනා, ඊට ද වඩා, වෙනත් කිසිවකින් නො ව සමාජ ප්‍රජාතන්ත්‍රවාදී (එනම් - විප්ලවවාදී) දෘෂ්ටි කෝනයකින් ප්‍රතිචාර දැක්වීමට ඔවුන් පුහුනු කල හොත් විනා, කම්කරු පන්තියේ විඥානයට අව්‍යාජ පන්ති විඥානය බවට පත් විය නො හේ. සංයුක්ත හා සියල්ලට මත් වඩා ස්ථානගත, දේශපාලන කරුනු හා සිද්ධීන් තුලින්, අනෙක් **සෑම** සමාජ පන්තියක ම, එහි බුද්ධිමය සදාචාරාත්මක හා දේශපාලනික ජීවිතය ප්‍රකට වන **සෑම** විටෙක දී ම නිරීක්ෂනය කිරීමට කම්කරුවන් උගත හොත් විනා, ජනගහනයේ **සියලු** පන්තීන්හි ස්තරයන්හි හා කන්ඩායම්වල, ජීවිතයේ හා ක්‍රියාකාරිත්වයේ **සියලු** පැතිකඩ සම්බන්ධයෙන් වන භෞතිකවාදී තක්සේරුව ව්‍යවහාරයට නැගීමට ඔවුන් උගත හොත් විනා, කම්කරු පන්ති විඥානයට අව්‍යාජ පන්ති විඥානය බවට පත් විය නො හැකි ය. කම්කරු පන්තියේ අවධානය, නිරීක්ෂනය හා විඥානය සුවිශේෂ ව ම නැත හොත් ප්‍රධාන වසයෙන් වුව තමා (කම්කරු පන්තිය-පරි.) කෙරෙහි ම පමනක් යොමු කරවන්නා වූ

යමෙක් වේ ද, ඔවුහු සමාජ ප්‍රජාතන්ත්‍රවාදියෝ නො වෙති. මක් නිසා ද යත්, කම්කරු පන්තියේ ස්වයං දැනුම, නූතන සමාජයේ සියලු වර්ගවල පන්ති අතර සම්බන්ධතාවන් පිලිබඳව, සිය දේශපාලන ජීවිතයේ අත්දැකීම් තුලින් අත්පත් කොට ගත් තනිකර ම සුපැහැදිලි න්‍යායික වැටහීමක් සමග නො වෙන් කල හැකි පරිද්දෙන් බැඳී නොපවතින නිසා ය. - ප්‍රායෝගික වැටහීම තරමට ම සරිලන න්‍යායික අවබෝධයක් සමග බැඳී නොපවතින බැව් පැවසීම වුව වඩා නිවැරදි විය හැකි ය. - මේ හේතුව නිසා, 'ආර්ථික අරගලයේ සංකල්පය මහජනයා දේශපාලන ව්‍යාපාරයට ඇද ගැනීමේ වඩාත් පුලුල්ව භාවිත කල හැකි මාධ්‍ය වෙතැ' යි අපේ ආර්ථිකවාදීන් දේශනා කරන අදහස අතිශය හානිදායක වන අතර, එහි ප්‍රායෝගික අර්ථභාරයෙන් ප්‍රතිගාමී වේ.'' [28]

කම්කරුවන්ගේ අවධානය ආකර්ෂනය කර ගැනීමේ සහ ඔවුන්ගේ සහාය දිනා ගැනීමේ ඉක්මන් ම හා පහසු ම මග, ආර්ථික හා 'වැඩ බිමේ' ගැටලු පිලිබඳව යොමු වීම බව -- සහ සමාජවාදීන් ප්‍රධාන වසයෙන් කටයුතු කල යුත්තේ කම්කරුවන්ගේ දෛනික ආර්ථික අරගලය තුල බව ද - තිර කොට පැවසූ සංශෝධනවාදීන්, සැබවින් ම ස්වයං සිද්ධ කම්කරු ව්‍යාපාරයේ සමාජවාදී විඥානයෙහි වර්ධනය පිනිස කිසිදු වැදගත් දායකත්වයක් ලබා නොදෙන බව ලෙනින් තරයේ පැවසී ය. ඇත්ත වසයෙන් ම, ඔවුන් කටයුතු කරමින් සිටියේ විප්ලවවාදී සමාජවාදීන් ලෙස නො ව, හුදු වෘත්තීය සමිතිකරුවන් ලෙස ය. සමාජවාදීන්ගේ සැබෑ අත්‍යවශ්‍ය කර්තව්‍යය වූයේ කම්කරුවන්ට, ඔවුන් ඒ වන විටත් දැන සිටි දේ ගැන -- කම්හලේ දෛනික හා රැකියා ප්‍රශ්න ගැන -- කථා කිරීම නො ව, ඔවුන්ගේ සමීප ආර්ථික අත්දැකීම්වලින් ග්‍රහනය නො කල හැකි දේශපාලන ඥානය සම්බන්ධව කතා කිරීම යි.

''බුද්ධිමතුන් වන ඔබට මෙම ඥානය ලබා ගත හැකි ය'' යි, කම්කරුවෙකුට සමීප හඬින් ලෙනින් කියයි. ''මෙතෙක් ඔබ අප වෙත ගෙන ආ පමන මෙන් සියදහස් ගුනයෙන් එසේ ලබා ගත් දෙය අප වෙත ගෙන ඒම ඔබේ කාර්යය යි. ඔබ විසින් එය අප වෙත ගෙන ආ යුත්තේ සාකච්ඡා, පත්‍රිකා සහ ලිපි (අපගේ අවංක භාවය පිලිබඳව කමන්න -- ඒවා බොහෝ විට නීරස ය) මාර්ගයෙන් පමනක් නො වේ. නිශ්චිතව කිව හොත් අපේ ආන්ඩුව ද අපේ පාලක පන්තීන් ද ජීවිතයේ සියලු අංශ තුල හරියට ම මේ මොහොතේ දී කුමක් කරමින් සිටිත් ද යන්න පිලිබඳව කෙරෙන විචිත්‍ර හෙලිදරව්වල මාර්ගයෙන් ද එම ඥානය ගෙන ආ යුතු ය.''[29]

කම්කරු පන්තියේ ආර්ථික අරගලවලින් ඉවත් ව හිඳීම කෙසේ වුවත්, ඒවා කෙරේ මන්දෝත්සාහී වීම හෝ සැබැවින්ම ලෙනින්ගේ උපදේශය නො වී ය. ඔහු විරුද්ධ වූයේ සමාජවාදීන් අසාධාරන හා අන්තරායකාරී ලෙස එවන් අරගලවලට කොටු වීමට ය. සිය උද්ඝෝෂන හා ප්‍රායෝගික වැඩ කටයුතු, ආර්ථික ඉල්ලීම් හා වෘත්තීය සමිති අරගලවලට සීමා කර ගැනීමේ ඔවුන්ගේ ප්‍රවනතාවට ය. සමාජය තුල විප්ලවවාදී බලවේගය ලෙස කම්කරු පන්තිය මුහුන දෙන තීරනාත්මක හා මූලික දේශපාලන කරුනු නො තකා හා මග හැර ගෙන සිටීමට ය. තව ද, සමාජවාදීන් වෘත්තීය සමිති අරගලයන්ට මැදිහත් වූ කල්හි, ඔවුන්ගේ සැබෑ වගකීම වූයේ ''ආර්ථික අරගලය විසින් කම්කරුවන් අතර ජනනය කෙරුනු දේශපාලන සවිඥානක භාවයේ ගිනි පුලිඟු, කම්කරුවන් **සමාජ ප්‍රජාතන්ත්‍රවාදී** දේශපාලන විඥානයේ මට්ටමට **ඔසවා ලීමේ** අභිප්‍රාය වෙනුවෙන් **භාවිත කිරීම**'' [30] බැව් ලෙනින් ලිවී ය.

*'කල යුත්තේ කුමක් ද?'* කෘතිය පිලිබඳ මෙම විචාරයට මා විසින් මේ සා විශාල කාලයක් කැප කිරීමට හේතුව ඔබ හැමට ද පැහැදිලි වේ යැයි මම බලාපොරොත්තු වෙමි. අප විසින් සැබවින් ම කතා කරමින් සිටියේ, ලෝක සමාජවාදී වෙබ් අඩවියෙහි ම න්‍යායය හා ඉදිරි දර්ශනය පිලිබඳව වීම එම හේතුව යි.

සමාප්තයි.

සටහන් :

(27) 5 වෙලුම පිටු 412 අවධාරනය මුල් කෘතියේ

(28) -එම- පිටු 412-413 අවධාරනය මුල් කෘතියේ.

(29) -එම- පිටු 417 - අවධාරනය මුල් කෘතියේ.

(30) -එම- පිටු 416 අවධාරනය මුල් කෘතියේ.

© www.wsws.org